# බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා වූ චර්යා ධර්ම සංග්‍රහය

**බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා වෙළඳපොළ චර්යා හා පුරුදු**

1. **චර්යා ධර්ම සංග්‍රහයේ විෂය පථය**

1.1 අන්තර්ජාතික ප්‍රශස්ථ පරිචයන්ට අනුකූලව බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය ඉහළ ප්‍රමිතියකින් සහ වෘත්තීය නිපුණතාවකින් යුතුව පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ වෙළඳපොළ චර්යා සහ පුරුදු තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චර්යා ධර්ම සංග්‍රහයක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

1.2 මෙය, 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10(සී) වගන්තිය යටතේ නිකුත් කරනු ලබයි. මෙම චර්යා ධර්ම සංග්‍රහය සහ 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසිය (මුදල් තැරැව්කරණ රෙගුලාසිය) අතර කිසියම් විෂමතාවක් ඇති වූ අවස්ථාවක, මුදල් තැරැව්කරණ රෙගුලාසිය අදාළ කර ගත යුතුය.

1.3 මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 2 යටතේ මුදල් මණ්ඩලය විසින් බලය පැවරීමේ සහතිකය නිකුත් කරන ලද සියලුම බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා මෙම යෝජිත රාමුව අදාළ විය යුතුය. මෙයට අමතරව ඒ.සී.අයි. ආදර්ශ රීති සංග්‍රහය (ACI Model Code) සහ ගෝලීය විදේශ විනිමය රීති සංග්‍රහය (Global Fx Code) අනුගමනය කළ යුතුය.

1.4 චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් හෝ කඩ කිරීම් මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 21 හි දක්වා ඇති දඬුවම්වලට යටත් වනු ඇත.

1.5 බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් චර්යා ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

2. **චර්යා ධර්ම සංග්‍රහයේ මූලධර්ම**

චර්යා ධර්ම සංග්‍රහයේ මූලධර්ම බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ යහ පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාර්ගෝපදේශන මාලාවක් සම්පාදනය කිරීමේ අරමුණින් සකස් කරන ලදී.

2.1 චර්යා ධර්ම සංග්‍රහයේ ආචාර ධර්ම සහ ප්‍රමිතීන්

(i) වෙළඳපොළ හැසිරීම

(ii) රහස්‍යභාවය

(iii) පුද්ගලික (තමන්ගේ) ගිණුමක ගනුදෙනු කිරීම

(iv) විනෝදාස්වාදය, තෑගි සහ ප්‍රසාද දීමනා

(v) ඔට්ටු ඇල්ලීම හා සූදු ක්‍රීඩා

2.2 සාමාන්‍ය ගනුදෙනු මූලධර්ම

(i) ගනුදෙනුවල සාකච්ඡා පටිගත කිරීම

(ii) කාර්යාලීය වේලාවෙන් පසුව සහ කාර්යාල පරිශ්‍රයෙන් පිටත ගනුදෙනු කිරීම

(iii) ගනුදෙනු අවලංගු කිරීම

(iv) සියලුම මුදල් තැරැව්කරණ කටයුතු පිළිබඳව වාර්තා තබාගැනීම

(v) ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පැවතීම

2.3 අවදානම් කළමනාකරණ මූලධර්ම

(i) රාජකාරී වෙන් කිරීම

(ii) අභ්‍යන්තර විගණන කටයුතු

2.4 ප්‍රමිති මට්ටම

(i) වෘත්තීය නිපුණතාව සහ දැනුම් මට්ටම

(ii) අවශ්‍ය සුදුසුකම්

3. **චර්යා ධර්ම සංග්‍රහයේ ආචාර ධර්ම සහ ප්‍රමිතීන්**

3.1 වෙළඳපොළ හැසිරීම

(i) බලයලත් මුදල් තැරැව්කරුවන් ඔවුන්ගේ චර්යාව තුළ පෞද්ගලික සහ වෘත්තීය අවංකභාවය ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් පෙන්නුම් කළ යුතුය.

(ii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම මගින් සියලුම ආකාරයේ වෙළඳපොළ අනිසි හැසිරීම් තහනම් කරන අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවිය යුතු අතර, කළමනාකාරිත්වය මගින් සෑම විටම ඒවා නිරීක්ෂණය කළ යුතුය.

(iii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම මුදල් තැරැව්කරණ කටයුතුවලදී ඔවුන්ගේ කුසලතාවයන් පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, එම කටයුතුවලදී යහපත් අරමුණකින් යුතුව කටයුතු කළ යුතුය.

(iv) බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් වෙළඳපොළ භාවිතා කරන්නන්ට හෝ නියාමනය කරන්නන්ට මිල, පොලී අනුපාතිකය සහ ඉල්ලුම ද ඇතුළුව පවතින වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳව ව්‍යාජ හෝ නොමඟ යවන සුළු අදහසක් ලබාදෙන ආකාරයේ විකෘති කිරීම් හෝ රැවටිලි සහගත හැසිරීමක් හෝ වෙනත් කිසියම් ආකාරයක හැසිරීමක නිරත වීමක් සිදු නොකළ යුතුය.

(v) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් සතුව ඇති ප්‍රසිද්ධ නොකරන ලද, මිල සංවේදී තොරතුරු හා ගනුදෙනු කිරීමේදී ඒ පිළිබඳව අතිශය සැලකිලිමත් විය යුතු අතර, එම තොරතුරු මත පදනම්ව ඔවුන් තම පෞද්ගලික ගිණුමක් වෙනුවෙන් ගනුදෙනු කිරීම හෝ වෙනත් පාර්ශ්වයකට එසේ ගනුදෙනු කිරීමට බලපෑම් කිරීම සිදු නොකිරීමට වගබලා ගත යුතුය.

(vi) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් හිතාමතාම කටකතා පැතිරවීම හෝ අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ව්‍යාප්ත කිරීම නොකළ යුතු අතර, මිල ගවේෂණ යාන්ත්‍රණය විකෘති හෝ අවභාවිත කිරීම නොකළ යුතුය.

(vii) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ අදාළ සමාගම්වල කොටස්කරුවෙකු සතු ප්‍රසිද්ධ නොකරන ලද වෙළෙඳපොළ තොරතුරු මත පදනම්ව ගනුදෙනුවක් සිදු කිරීමට එවැනි පාර්ශ්වයක් සතු අනිසි බලපෑමක් වේ නම් බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් වහාම දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ/ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය.

(viii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් තම අනන්‍යතාවය සහිතව වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබඳව කිසිදු තොරතුරක් මාධ්‍ය වෙත ලබා නොදිය යුතු අතර, එවැනි ප්‍රකාශයන් කිරීමේ දී ඔවුන්ගේ අනන්‍යතාවය සහිතව කළ යුතු වේ.

(ix) බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් වෙනත් කිසියම් බලයලත් මුදල් තැරැව්කරුවෙකු සිදු කරන අක්‍රමිකතා සහ වැරදි කිරීම් පිළිබඳව සංඥා/සාක්ෂි පිළිබඳව සහ/හෝ වෙනත් ඕනෑම පාර්ශ්වයක එවැනි ගනුදෙනුවක් සම්බන්ධ සංඥා/සාක්ෂි පිළිබඳව දැනුවත් වූයේ නම් එය දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ/ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය.

3.2 රහස්‍යභාවය

(i) මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 11 (උ) හි නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට, මුදල් තැරැව්කරණ රෙගුලාසිය මගින් අනුමත කරන ලද තොරතුරු හැර, ගනුදෙනුව පිළිබඳ තොරතුරු බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් කිසිම පාර්ශ්වයකට අනාවරණය නොකළ යුතුය.

(ii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් පාර්ශ්වකරුවන්ගේ ගනුදෙනු සහිත තොරතුරු ඇතුළුව සියලු කාරණාවලදී රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ඒ සඳහා සහාය දීම කළ යුතුය. එසේම, රහස්‍යභාවය නිසි ලෙස පවත්වාගෙන යාම තුළින් වෙළෙඳපොළ අවංකභාවය සුරක්ෂිත කිරීම සඳහා එක හා සමාන වගකීමකින් දායක විය යුතු වේ.

(iii) ප්‍රකාශයට පත් නොකරන ලද සංවේදී තොරතුරු හඳුනා ගැනීමට සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ඔවුන්ගේ කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය. එසේම, රහස්‍ය තොරතුරු ඇතුළත් මාධ්‍යයන් නිසි ලෙස හැසිරවීම සඳහා සුදුසු ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කළ යුතුය.

(iv) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ප්‍රකාශයට පත් නොකළ සංවේදී තොරතුරු ඔවුන්ගේ ප්‍රතිලාභ සඳහා හෝ ඔවුන්ගේ නියෝජිතයකු හෝ දන්නා පාර්ශ්වයක ප්‍රතිලාභය සඳහා හෝ එවැනි පොදු නොවන තොරතුරු පදනම් කරගෙන වෙනත් පාර්ශ්වයකට බලපෑම් කිරීම සිදු නොකළ යුතුය.

(v) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ජංගම දුරකථන මගින් හෝ වෙනත් ඕනෑම මාධ්‍යකින් පොදු ස්ථානවලදී පාර්ශ්වකරුවන්ගේ කටයුතු පිළිබඳව සාකච්ඡා නොකිරීමට සැලකිලිමත් විය යුතුය. එසේම, රහසිගත තොරතුරු අඩංගු ඕනෑම ලේඛනයක්, විද්‍යුත් මාධ්‍යක් හෝ පුද්ගලික පරිගණක පොදු ස්ථානවල තබා යා නොයුතුය.

(vi) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් තොරතුරු අනාවරණය කිරීම සඳහා යම් අයෙකුට කිසියම් ආකාරයේ පෙළඹවීමක්, බලපෑම් කිරීමක්, පොරොන්දු වීමක් හෝ වෙනත් නුසුදුසු ක්‍රමවේදයක් අනුගමනය නොකළ යුතුය. එසේම, බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ඔවුන්ගේ පාර්ශ්වකරුවන්ගේ රහසිගත තොරතුරු අනාවරණය කිරීම සඳහා වන ඕනෑම ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ යුතුය. එසේම, එවැනි සිදුවීම් වහාම ඔවුන්ගේ කළමනාකාරිත්වයට, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂකට සහ ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂකට දැනුම් දිය යුතුය.

3.3 පෞද්ගලික (තමා සතු) ගිණුමක කටයුතු කිරීම

(i) මුදල් තැරැව්කරණ රෙගුලාසි අංක 9 හි නියම කර ඇති ආකාරයට මූල්‍ය උපකරණවල ගනුදෙනු කිරීමේදී කිසිදු බලයලත් මුදල් තැරැව්කරුවෙකු හෝ බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක සේවකයකු තමන් වෙනුවෙන් සේවාදායකයෙකුට ගනුදෙනුකාර පාර්ශ්වයක් ලෙස හෝ ප්‍රධානියෙකු ලෙස කටයුතු නොකළ යුතුය.

(ii) මුදල් තැරැව්කරණ රෙගුලාසි අංක 9 හි නියම කර ඇති පරිදි කිසිදු බලයලත් මුදල් තැරැව්කරුවෙකු හෝ බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක සේවකයෙකු, පවුලේ සමීප ඥාතියෙකු හෝ මිතුරෙකු හෝ වෙනත් ඥාති පාර්ශ්වයක් උදෙසා කිසිදු මූල්‍ය උපකරණයක ගනුදෙනු කිරීම/වෙළෙඳාම් කිරීම නොකළ යුතුය.

(iii) සේවකයින් තම පුද්ගලික මූල්‍යමය කරුණු/අපේක්ෂාවන් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව පූර්ණ විවෘතභාවය හා විනිවිදභාවය සහතික කරමින් ඔවුන්ගේ පූර්ණ අවධානය මුදල් තැරැව්කරණ ව්‍යාපාරය කෙරෙහි යෙදිය යුතුය.

(iv) බලයලත් මුදල් තැරැව්කරුවන් තම බැඳියාවන් අතර ගැටීම්, ආචාරධර්ම හෝ වෘත්තීය විනිශ්චයන් සඳහා තිබිය හැකි හා ඇති විය හැකි බාධාවන් හඳුනා ගත යුතුය. බලයලත් මුදල් තැරැව්කරණ ආයතන එවැනි බැඳියාවන් අතර ගැටීම් අනාවරණය කර එවැනි ගැටීම් වළක්වා ගැනීමට වහාම පියවර ගත යුතුය.

3.4 විනෝදාස්වාදය, ත්‍යාග හා අනුග්‍රහය දැක්වීම්

(i) සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ත්‍යාග හා විනෝදාස්වාදය සැපයිය හැකි වුවද සේවකයින් ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා නුසුදුසු සහන පිරිනැමීම, වෙනත් ආයතනවල පුද්ගලයන් ඒ සඳහා පෙළඹවීම කිසිදු විටෙක නොකළ යුතුය.

(ii) කළමනාකාරිත්වය විසින් සේවකයින්ට විනෝදාස්වාද/ත්‍යාග ලැබෙන ආකාරය, වාර ගණන හා පිරිවැය අධීක්ෂණය කළ යුතු අතර, එවැනි දෑ ලබාදීම/ලබාගැනීම සම්බන්ධව පැහැදිලි ප්‍රකාශිත ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර, එම ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාවෙහි යෙදවීම සහතික කළ යුතුය.

(iii) ත්‍යාගවල අධිකභාවය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී වරදකට හේතු නොවන ලෙස බැහැර කළ නොහැකි සහ ලැබෙන සහ ලබාදෙනු ලැබූ සියලුම විනෝදාස්වාදයන්හි විනිවිදභාවය තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කළ යුතුය.

(iv) බලයලත් මුදල් තැරැව්කාර ආයතන විසින් ඔවුන්ගේ පවුල්, ඥාතීන් සහ වෙනත් දන්නා පාර්ශ්වයන් සඳහා තම ගනුදෙනුකාර පාර්ශ්වයකින් සාධාරණත්වය හා අවංකභාවය පිළිබඳව ව්‍යවහාර සම්මතයන් හා ගැටෙන කිසිදු නුසුදුසු අනුග්‍රහයන් ඉල්ලා නොසිටිය යුතුය.

3.5 ඔට්ටු ඇල්ලීම හා සූදු ක්‍රීඩා

(i) වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර සූදු හා ඔට්ටු තැබීම් පැහැදිලිවම අන්තරායක් වන අතර ඒවා දැඩි ලෙස තහනම් කළ යුතුය.

4. **පොදු ගනුදෙනු මූලධර්ම**

4.1 ගනුදෙනුවල සංවාද පටිගත කිරීම

(i) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් සතු හඬ පටිගත කිරීමේ පද්ධතියට හඬ පටිගත කිරීමට සහ එක් එක් ගනුදෙනුවලට අදාළ සංවාදයන්හි දුරකථන අංකය, දිනය හා වේලාව සමග අනුක්‍රමිකව අංක කර ගබඩා කර තබාගැනීමේ හැකියාව තිබිය යුතුය.

(ii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් සුදුසු දත්ත හා හඬ පටිගත කිරීමේ අවශ්‍යතාව සහතික කරමින් ජාත්‍යන්තර ප්‍රශස්ථ පරිචයන්ට අනුකූලව අභ්‍යන්තර ප්‍රතිපත්තීන් සකස් කළ යුතුය.

(iii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් දුරකථන සංවාද වාර්තා, ආයතන පරිශ්‍රයෙහි ස්වාධීනව ගබඩා කිරීමටත් එවැනි වාර්තා භාවිතයේදී හෝ ගබඩාවේදී ඒවාට හානි නොවන ලෙස ප්‍රවේශය දැඩි ලෙස සීමා කිරීම සහතික කළ යුතුවේ.

(iv) පටිගත කිරීමේ පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සහතික කර ගැනීම සඳහා බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් කලින් කලට පටිගත කිරීමේ පද්ධතිය පරීක්ෂා කළ යුතුය.

(v) බලයලත් මුදල් තැරැව්කරණ ආයතන විසින් හඬ පටිගත කිරීමේ පද්ධතියේ හා අනෙකුත් බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගන්නා සේවා සඳහා ගිවිසුම් පවත්වා ගෙන යා යුතුය.

4.2 කාර්යාල වේලාවෙන් පසුව හා කාර්යාල පරිශ්‍රයෙන් පිටතදී ගනුදෙනු කිරීම

(i) කාර්යාල පරිශ්‍රයෙන් බැහැර ගනුදෙනු සඳහා අවසර නොලැබෙන අතර කාර්යාල වේලාවෙන් පසුව කරන ගනුදෙනුවලදී, එසේ කාර්යාල වේලාවෙන් බැහැරව ගනුදෙනු කිරීමට අවසර ලබා ඇති සේවකයන් ලැයිස්තුගත කළ යුතු අතර, එම ගනුදෙනු අප්‍රමාදව වාර්තා කිරීම හා පටිගත කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් සකස් කළ යුතුය.

(ii) වාර්තා කිරීම ලිඛිත ආකෘතියකින් ඉදිරිපත් කළ යුතුය. වාචික වාර්තාකරණයකදී හඬ තැපැල් (voice mail) මෙවලම් ස්ථාපිත කර ස්ථානගත කළ යුතු අතර, වාර්තා කළ ගනුදෙනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව මැකිය නොහැක.

(iii) සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පසුව සිදුකරන ගනුදෙනුවලදී අදාළ ගනුදෙනු පිළිබඳ සීමා සහ අවසරලත් ගනුදෙනු වර්ග පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැදිලි ලිඛිත මාර්ගෝපදේශ සේවකයින්ට ලබාදිය යුතුය.

4.3 මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය (Central Integrated Market Monitor) හරහා උඩුගත කළ ගනුදෙනු අවලංගු කිරීම

(i) වාර්තා කළ ගනුදෙනු අවලංගු කිරීම කළ යුතු වන්නේ ගනුදෙනුවට සම්බන්ධ සියලු පාර්ශ්ව එම ගනුදෙනුව අවලංගු කිරීමට එකග වන්නේ නම් පමණි. එවැනි අවලංගු කළ ගනුදෙනුවට අදාළ සියලු තොරතුරු, එම ගනුදෙනුව අවලංගු

කරන දිනයේදීම ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ, ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල භාවිතයෙන් වාර්තා කළ යුතුය.

(ii) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතියට වැරදි සහගත ලෙස වාර්තා කළ ගනුදෙනු නිවැරදි කර තිබේදැයි පසුව පරීක්ෂා කර බැලිය යුතුවේ.

4.4 සියලුම මුදල් තැරැව්කරණ කටයුතු පිළිබඳ වාර්තා තබාගැනීම

(i) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ගනුදෙනුකාර පාර්ශ්ව සමඟ සිදු කරන ගනුදෙනු සම්බන්ධ ලිඛිත සාක්ෂි විද්‍යුත් මාධ්‍යයෙන් හෝ වෙනත් ආකාරයකින් මුදල් තැරැව්කරණ රෙගුලාසි අංක 16 හි නියම කර ඇති කාලසීමාවක් සඳහා පවත්වාගෙන යා යුතු අතර, එම ලිපිලේඛන නියාමකයාට අවශ්‍ය වූ විට ලබාදිය යුතුය.

(ii) බලයලත් මුදල් තැරැව්කරණ ආයතන විසින් ගිණුම් පොත් හා වෙනත් වාර්තා කටයුතු නිසි ලෙස මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි රෙගුලාසි අංක 16 හි නියම කර ඇති කාලසීමාව සඳහා නඩත්තු කළ යුතු අතර, ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එම ලිපිගොනු නියාමන අධිකාරීන් වෙත ලබාදීමේ වගකීම බලයලත් මුදල් තැරැව්කරණ ආයතන වෙත පැවරේ.

4.5 ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පවත්වා ගැනීම

(i) බලයලත් මුදල් තැරැව්කරණ ආයතන ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් උපායයන් සහ සවිස්තරාත්මක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පිළියෙළ කළ යුතු අතර, එය ඔවුන්ගේ මෙහෙයුම් අත්පොතට ඇතුළත් කළ යුතුය.

(ii) ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ක්‍රියාවලිය අවම වශයෙන් වසරකට වරක්වත් යාවත්කාලීන කිරීම හා පරීක්ෂණයට ලක්කිරීම සිදු කළ යුතුය.

**5. අවදානම් කළමනාකරණ මූලධර්ම**

5.1 රාජකාරී වෙන් කිරීම්

මුදල් තැරැව්කරණ කටයුතු සම්බන්ධ ඉදිරි මෙහෙයුම් කාර්යාල හා පසු මෙහෙයුම් කාර්යාල, භෞතික වශයෙන් හා රාජකාරී වශයෙන් නිසියාකාරව වෙන්කර ඇති බවට බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් සහතික කළ යුතුය.

5.2 අභ්‍යන්තර විගණන කටයුතු

(i) බලයලත් මුදල් තැරැව්කරණ ආයතන විසින් මුදල් තැරැව්කරණ ක්‍රියාකාරකම් සම්බන්ධව අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව, නිරවද්‍යතාව සහ අනුකූල වීම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන කටයුතු කාලානුරූපීව සමාලෝචනය කිරීම සහතික කළ යුතුය.

(ii) මෙම සමාලෝචනය මගින් ගනුදෙනු වාර්තා කිරීමේ නිරවද්‍යතාව සහ සම්පූර්ණ බව, රාජකාරීන් හි ඵලදායී වෙන් කිරීම, දීමනා ලබාදීම නිවැරදිව වාර්තා කිරීම, කාර්යසාධනය සම්බන්ධිත දීමනා ගෙවීම දෛනික උපස්ථ ක්‍රියාවලිය හා අදාළ සියලු අභ්‍යන්තර පාලනයන් ඇතුළත්ව මුදල් තැරැව්කරණ කටයුතු පිළිබඳ ඵලදායී පාලනයක් සහතික කළ යුතුය.

**6.0 ප්‍රමිති මට්ටම**

6.1 වෘත්තීයමයභාවය හා දැනුම් මට්ටම

(i) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් වෙළඳපොළ පුරුදු හා හැසිරීම පිළිබඳව වෙළඳපොළේ සමස්ත වෘත්තීයමය ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා නිරතුරුව ඉහළ මට්ටමේ දැනුවත් භාවයක් සහ අවබෝධයක් පවත්වාගෙන යා යුතුය. බලයලත් මුදල් තැරැව්කරණ ආයතන දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සහ නියාමනයන්හි වැඩිදියුණු වීම් පිළිබඳව ඉහළ මට්ටමේ දැනුවත්භාවයක් හා අවබෝධයක් පවත්වාගත යුතු අතර, විධිමත් පුහුණුවක් හා සංවර්ධනයක් තුළින් ඔවුන්ගේ වෘත්තීය දැනුම ක්‍රමානුකූලව යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම කළ යුතුය.

6.2 අවශ්‍ය සුදුසුකම්

(i) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමෙහි අලෙවිකරුවන් පහත සඳහන් අවම සුදුසුකම/සුදුසුකම් සපුරා ගත යුතුය.

(අ) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් පිරිනමන මුදල් තැරැව්කරණ සහතිකය

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියසෙන් පිරිනමනු ලබන භාණ්ඩාගාර හා විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ/ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන වෙනත් අදාළ වෘත්තීමය සුදුසුකම්

(ඈ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමට ඉහත අවම සුදුසුකම්වලට අමතරව අදාළ විෂය ක්ෂේත්‍රය තුළ වෙනත් අතිරේක සුදුසුකම් අත්කර ගත හැකිය.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව**